www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාන න්‍යෂ්ටික ගැටුම පිටුපස ඇති දේශපාලන ප්‍රශ්න

**The political issues behind the Iranian nuclear confrontation**

**කර්තෘ මන්ඩලය විසිනි**

**2006 ජනවාරි 21**

ඉරානයේ න්‍යෂ්ටික වැඩපිලිවෙල මුල් කර ගෙන ප්‍රධාන බලවතුන් හා ඉරානය අතර පැතිරයමින් ඇති ගැටුම තීරනාත්මක දේශපාලන ප්‍රශ්න මතු කරයි.

බුෂ් පරිපාලනය යලි වතාවක් නොසැලකිලිමත් ලෙස මිලිටරි ගැටුම සඳහා මාවත සකසමින් සිටියි. නැවතත් යුරෝපීය බලවතුන්, රුසියාව හා චීනය වොෂින්ටනයේ ඉල්ලීම් ද, ඉරානය හා මැද පෙරදිග තුල ඔවුන්ගේ ම ආර්ථික උවමනාවන් ද අතර හිරවී ඇති අතර එක්සත් ජනපදයට සහන පිදීමේ තැනට පත්ව සිටිති. ආර්ථික සම්බාධක පැනවීම දැනට සාකච්ඡාවට බඳුන්වෙතත් ධවල මන්දිරය යලි යලිත් පැහැදිලි කොට ඇත්තේ හමුදා ප්‍රහාරයක් ද ඇතුලත් " සියලුම විකල්පයන් මේසය මත" තිබෙන බව යි.

යුරෝපා සංගමයේ තුන්කට්ටුව - බ්‍රිතාන්‍ය, ප්‍රන්සය හා ජර්මනිය - දැඩි සම්බාධක පැනවීම සඳහා ඉරානය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය වෙත යොමු කිරීමට ජාත්‍යන්තර පරමානු බල ශක්ති ආයතනයේ (අයිඒඊඒ) රැස්වීමක් කැඳවුම් කර තිබේ. රුසියාව හා චීනය අවසන් එකඟතාවකට පැමිනිය යුතුව තිබේ. කෙසේ වුව ද සඳුදා ලන්ඩනයේ පැවති රැස්වීමක දී ඉරානය එහි යුරේනියම් පෝෂනය කිරීමේ කටයුතු " සම්පූර්නයෙන් ම අත් හිටුවීම කරා" පැමිනිය යුතු ය යන එක්සත් ජනපද තීරනයට පස්දෙනාම එකඟ වීම මගින් ටෙහෙරානයට එරෙහි ආක්‍රමනශීලී පියවර දැඩි කිරීම සඳහා නිමිත්ත සම්පාදනය කෙරෙයි.

ජාත්‍යන්තර මාධ්‍ය නිමක් නැතිව ප්‍රතිචක්‍රීය කරනය කල ඉරානයට එරෙහිව එක්සත් ජාතීන් (එජා) ක්‍රියාත්මක විය යුතුය යන සමස්ත තර්කය ම නරුමත්වයේ හා කුහකකමේ දුගඳින් පිරී ඇත. එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ප්‍රන්සය, රුසියාව හා චීනය යන එජා ආරක්ෂක මන්ඩලයේ ස්ථිර සාමාජිකයන් පස්දෙනාම න්‍යෂ්ටික අවි සතුව සිටින අතර න්‍යෂ්ටික අවි හරන ගිවිසුමට (එන්පීටී) අත්සන් තැබූවන් ලෙස ඔවුන් සතු දැවැන්ත අවි තොග විනාශ කිරීමේ වගකීම ඉටු කිරීමට අසමත්ව සිටිති.

මෙම අවි තොග පිලිබඳව කිසි ම සාමයක් ඇත්තේ නැත. එයට වෙනස් ලෙස ඔවුන්ගේ අරමුන වන්නේ පසු ගිය බ්‍රහස්පතින්දා ප්‍රන්ස ජනාධිපති ජැක් චිරාක්ගේ ප්‍රකෝපකාරී ප්‍රකාශ මගින් පැහැදිලි කල පරිදි අඩන්තේට්ටම් කිරීම, තර්ජනය කිරීම හා අවසන් වසයෙන් දුබල ජාතීන්ට එරෙහිව ඒවා යොදාගැනීම යි. බ්‍රිට්නිහි න්‍යෂ්ටික සබ්මැරීන් කඳවුරෙහි සිට කථාකරමින් චිරාක් අනතුරු ඇඟවූයේ ප්‍රන්සයේ වැදගත් අවශ්‍යතාවන්ට එරෙහිව ත්‍රස්තවාදී ප්‍රහාරවලට අනුග්‍රහ දක්වන ඕනෑ ම රාජ්‍යයකට විරුද්ධව න්‍යෂ්ටික අවි යොදාගැනීමට ප්‍රන්සය පසුබට නොවනු ඇති බව යි. "අපගේ (න්‍යෂ්ටික) මූලෝපායාත්මක බලවේගයන්හි නම්‍යශීලිත්වය හා ප්‍රතික්‍රියා ශක්තිය මගින් බල මධ්‍යස්ථානයන් වෙත ඍජුව ම ප්‍රතිචාර දැක්වීමට අපට ඉඩ සලසයි." යනුවෙන් ඔහු ප්‍රකාශ කලේ ය.

ආර්ථික සම්බාධක හා මිලිටරි ප්‍රහාරයන් ද අන්තර්ගත වූ, ඉරානයේ න්‍යෂ්ටික වැඩ පිලිවෙල කෙරෙහි, තර්ජනාත්මක දෙපිටකාට්ටුකම මෙසේ යොදා ගන්නා අතර එක්සත් ජනපදයේ මිතුරු ඊස්රායලය, ඉන්දියාව හා පකිස්ථානය දැනට මත් න්‍යෂ්ටික අවි සතු කර ගෙන සිටියි. බ්‍රසීලය වැනි අනෙකුත් රටවල් තුල එන්පීටීය යටතේ නීති විරෝධී නොවන යුරේනියම් පෝෂනය කිරීමේ බලාගාර එක්කෝ ඉදි කර නැත්නම් ඉදි කෙරෙමින් තිබේ.

ඉරාකය තුල ඇතැයි සැකයට පාත්‍ර වූ ජනඝාතක අවි ප්‍රශ්නය පරිද්දෙන් ම ඉරානයේ "න්‍යෂ්ටික තර්ජනය ද සම්පත් බහුල ප්‍රදේශයේ අසීමිත ආධිපත්‍ය සඳහා වන බුෂ් පරිපාලනයේ අභිලාෂයන් පෙරට ගෙන යාමට ගසාකනු ලැබේ. ලෝකයේ තෙවෙනි විශාලතම තෙල් නිධි ද, දෙවැනි විශාලතම ස්වාභාවික ගෑස් නිධි ද, සතු ඉරානය මැද පෙරදිග, මධ්‍යම ආසියාවේ හා එන්ට එන්ටම වැදගත්වන ඉන්දීය උපමහාද්වීපයෙහි ප්‍රමුඛ ස්ථානයක් අරා සිටියි. ඉරාන බල තන්ත්‍රය සියලු න්‍යෂ්ටික වැඩ පිලිවෙලවල් අත හැර එහි න්‍යෂ්ටික පහසුකම් මුලුමනින් ම විනාශ කලත්, ඇමරිකාවේ යුරෝපීය හා ආසියානු ප්‍රතිමල්ලවයන් මත එක්සත් ජනපද අධිකාරය පිහිටුවාගැනීම අරමුනු කර ගෙන සිටින වොෂින්ටනය එහි ප්‍රකෝපකාරී කටයුතු සඳහා තවත් නිමිත්තක් සොයා ගනු ඇත.

මැද පෙරදිග තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ කොල්ලකාරී ක්‍රියා කලාපයට එරෙහි වීමේ දී ලෝක සමාජවාදී වෙබ් අඩවිය, ටෙහෙරානයේ ප්‍රතිගාමී

පූජකවාදී බලතන්ත්‍රයට හෝ එම පාර්ශ්වයේ න්‍යෂ්ටික අවි අත්කර ගැනීමේ කුමන හෝ උත්සාහයකට සහාය නො දක්වයි. 1979 දී ෂා රේසා පාලවී පෙරලා දැමීමෙන් පසුව ගොඩ නැගුනු ඉස්ලාමි සමූහාන්ඩුව නියෝජනය කලේ වෛරයට පාත්‍රව තිබූ ආඥාදායකත්වය බිඳ හෙලනු ලැබූ වැඩ කරන ජනතාව නොව, විරසකව සිටි ධනේශ්වරයේ කොටස්වල අවශ්‍යතාව යි. රුදුරු මර්දනය තුලින් ගෙන ගිය ඔවුන්ගේ පාලනය යොමු කර තිබුනේ සියල්ලට මත් වඩා කම්කරු පන්තියේ මොන ම ස්වාධීන ව්‍යාපාරයකට හෝ එරෙහිව ය.

නවතම තර්ජනයන්ට ප්‍රතිචාර වසයෙන් ජනාධිපති මොහොමඩ් අහමඩිනිජාඩ් ප්‍රකාශ කර ඇත්තේ, තම ආන්ඩුව එජා ආරක්ෂක මන්ඩලය නොතකා හරිමින්, යුරේනියම් පෝෂනය සංවර්ධනය කිරීමේ සැලසුම් ඉදිරියට ගෙන යන බවයි. පසු ගිය සති අන්ත මාධ්‍ය හමුවක දී ඔහු හැඳින්වූ "මැරවරයන්ගේ මධ්‍යකාලීන ආකල්පය" හෙලා දකිමින් "ඔබ පසුතැවිලිවන වේලාවක් පැමිනෙනු ඇතැයි ද එවිට පසුතැවීමෙන් පලක් නොවනු ඇතැයි ද," යන වැනෙන සුලු තර්ජනය ද ඔහු එල්ල කලේ ය. අහස උසට නැගෙන තෙල් මිල පිලිබඳ අන්තරාය ඇඟවුම් කරමින් ඔහු ප්‍රකාශ කලේ " ඔවුන් අපව කොටු කරමින් අප සමග කටයුතු කලේ කර්කෂ හා නීති විරෝධී භාෂාවකිනි. එහෙත් අවසානයේ දී අපට ඔවුන් අවශ්‍යවනවාට වඩා ඔවුන්ට අපව අවශ්‍ය වෙයි." යනුවෙනි.

කිසිවෙකුත් අහමඩිනිජාඩ්ගේ බොරු චන්ඩිකම් සැබෑ අධිරාජ්‍ය විරෝධී අරගලයක් ලෙස වරදවා වටහා නො ගත යුතු ය. මෙම තුනී අභියෝගයෙහි අරමුන වන්නේ ඉරාන ධනේශ්වරය සඳහා වඩාත් වාසිදායක සබඳතාවයක් වෙනුවෙන් ප්‍රධාන බලවතුන්ට බලපෑම් කිරීමත්, ප්‍රාදේශීය බලවතෙකු ලෙස ඉරානයේ තත්වය ශක්තිමත් කර ගැනීමත් ය. පසු ගිය දෙවසරෙහි ටෙහෙරානය යුරෝපීය සංගමය සමඟ සීමිත ආර්ථික හා දේශපාලන සබඳතාවන් වෙනුවෙන් විධිමත් එකඟතාවක් ඇති කර ගැනීම සඳහා එක්සත් ජනපදය හා යුරෝපීය බලවතුන් අතර උපාමාරු දැමීමේ දී, ඊට හිලව් වසයෙන් සිය න්‍යෂ්ටික වැඩ පිලිවෙලෙහි යම් බුරුල්කිරීමක් මත න්‍යෂ්ටික ප්‍රශ්නය යොදා ගැනීමට උත්සුක විය.

ඊස්රායලයට පිටුබලය දෙන හා "තමන්ගේම ආරක්ෂාව සලසාගැනීම සඳහා අනෙකුත් රටවල් තුල යුද්ධයන් ගෙන යන" අය "යුද අපරාධකරුවන්" යයි අහමඩිනිජාඩ් අනියමින් සඳහන් කලේ ය. එහෙත් බුෂ් පරිපාලනයට එරෙහිව එහි සියලු රඟපෑම් මධ්‍යයේ ඉරාන බලතන්ත්‍රය, ඉරාකය හා ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද යුද අපරාධයන්හි සහකරුවෙක් වෙයි. එහි විධිමත් විරුද්ධත්වය තිබිය දී ම ටෙහෙරානය, එක්සත් ජනපදය මෙහෙය වූ ඉරාක ආක්‍රමනය සමග සහයෝගී වූයේ එහි ප්‍රාදේශීය පස මිතුරාගේ පරාජයෙන් පමනක් තමාගේ තත්වය ශක්තිමත් වේ යයි ගනන් බලමිනි. ඉරාකය තුල ම, ඉරාන බල තන්ත්‍රය සමග සමීපව සන්ධානගතව සිටින ඉරාකයේ ඉස්ලාමීය විප්ලවයේ උත්තරීතර මන්ඩලය (එස්සීඅයිආර්අයි) ආක්‍රමනයට විවෘතව සහාය දුන් අතර දැන් එක්සත් ජනපද රූකඩ බල තන්ත්‍රයේ මධ්‍යම අවයවයක් ලෙස සකස් වී ඇත.

අහමඩිනිජාඩ් පසු ගිය සති අන්තයේ ඇල්මැරුනු ආකාරයෙන් ප්‍රකාශ කලේ "අපගේ අරමුන න්‍යෂ්ටික තාක්ෂනය සාමකාමී ලෙස යොදා ගැනීම බවයි." ඔහු යලිත් අවධාරනය කලේ න්‍යෂ්ටික ඉන්ධන චක්‍රයේ සියලු අංශ සංවර්ධනය කිරීමට න්‍යෂ්ටික අවි හරන ගිවිසුම යටතේ ඉරානය සතු අයිතිය යි. ඔහුගේ ප්‍රසිද්ධ ප්‍රකාශන කෙසේ වෙතත්, ජනාධිපති පූජක තන්ත්‍රයේ අතිශය දක්ෂිනාංශික කොටස්වලට බැඳී ඇති අතර ඔවුන් අවධාරනය කරන්නේ ඉරානයට න්‍යෂ්ටික බලාගාර පමනක් නොව න්‍යෂ්ටික අවි ද තිබිය යුතු බවයි. ඉන්දියාව දකුනු ආසියාව තුල කිරීමට උත්සාහ දරන ආකාරයට ම මැද පෙරදිග තුල ඉරානය ප්‍රාදේශීය බලවතෙකු ලෙස පිහිටුවා ගැනීමේ මාධ්‍යයන් ලෙස න්‍යෂ්ටික අවි ගොඩනැගීම දක්නට ලැබේ.

ඉරානයට න්‍යෂ්ටික අවි අත් කර ගත හැකි නම්, 1998 න්‍යෂ්ටික අත්හදාබැලීම්වලින් පසුව නව දිල්ලිය සමග ඇති කර ගත් ආකාරයේ එකඟතාවයක් ටෙහෙරානය සමග ද ඇති කර ගැනීමට එක්සත් ජනපදයට බල කෙරෙනු ඇතැයි ගනන් බලන හෝ වැරදි ගනන් බැලීමක යෙදෙන්නවුන් ඉරාන බල තන්ත්‍රය තුල සිටින්නේ ය යන්න නිසැක ය. කෙසේ වුවද ඉරානයේ ප්‍රාථමික ගොරහැඩි න්‍යෂ්ටික අවි කිහිපයක්, එක්සත් ජනපද ආක්‍රමනයකට බැරෑරුම් ලෙස මග වලකනු නැත. සැබැවින් ම ඉරානය න්‍යෂ්ටික අවියක් ගොඩනැගීම හා අත්හදා බැලීමකින් සිදු වනු ඇත්තේ එක්සත් ජනපදය හා එහි මිත්‍ර පාක්ෂිකයන් විසින් එල්ල කරන, ව්‍යසනකාරී ප්‍රතිඵල ගෙන දෙන්නා වූ මිලිටරි ප්‍රහාරයක් හෝ පූර්න යුද්ධයක අන්තරාය උත්සන්න වීම පමනි.

ඉරානය හා උතුරු කොරියාව වැනි රටවල් විසින් න්‍යෂ්ටික අවි අත් කර ගැනීම තුලින් හා ඊස්රායලයේ, දකුනු කොරියාවේ හෝ අන් කොතැනක හෝ අහිංසක වැඩ කරන ජනතාව මිලියන ගනනක් ගිනි බත් කිරීමේ ලේ කැටිගැහෙන තර්ජනයන් තුලින් අධිරාජ්‍යවාදී යුද්ධයේ අන්තරාය අවසන් නො වනු ඇත. එවන් තර්ජන ඍජු ලෙස ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අනට ක්‍රීඩා කිරීමකි.

නාසි ජන සංහාරය ප්‍රතික්ෂේප කරමින් ද, ඊස්රායල් රාජ්‍යය "සිතියමෙන් අතුගා දැමීම" සඳහා කැඳවුම් කරමින් ද කල අහමඩිනිජාඩ්ගේ යුද විරෝධී ප්‍රකාශවලින් ජනිත කල කෝපය ඉරානයට එරෙහිව දැන් සිදු වන

ජාත්‍යන්තර ක්‍රියා මාර්ගය යුක්ති සහගත කිරීම සඳහා වොෂින්ටනය විසින් ගසාකනු ලැබ ඇත.

ජාතිකවාදයට හා විදේශික විරෝධයට කෙලින්ම ආමන්ත්‍රනය කෙරෙන අහමඩිනිජාඩ්ගේ ප්‍රකාශ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ පුපුරා හැලීමට එරෙහිව සටන්වැදීමේ දී සමාජවාදී ක්‍රියාමාර්ගයක් සඳහා අරගලයේ පදනම මත ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් යුද්ධයට හා අධිරාජ්‍යවාදී මර්දනයට එරෙහිව පුලුල් භූගෝලීය ප්‍රතිප්‍රහාරයක් වර්ධනය කිරීමේ එකම ප්‍රායෝගික හා ප්‍රගතිශීලී මූලෝපායට හරස්ව පිහිටා සිටියි. ඉරාන වැඩ කරන ජනතාවගේ සැබෑ මිතුරන් වන්නේ ඊස්රායලය ද ඇතුලත් මැද පෙරදිග පුරා ද, එක්සත් ජනපදයේ මෙන් ම යුරෝපයේ හා ජාත්‍යන්තරව ද විසිර සිටින කම්කරුවන් මිස අහමඩිනිජාඩ් වැනි වාචාල දේශපාලනඥයන් හෝ ඉරාන ධනේශ්වරයේ වෙනත් කිසියම් කොටසක් හෝ නො වේ.

කම්කරු පන්තියේ කර මත බර පැටවීම හැරෙන්නට අන් කිසිදු විසඳුමක් ධනපති පන්තියේ කුමන කොටසකට හෝ නො තිබුනු තතු තුල ඉරානයේ ගැඹුරුවන ආර්ථික හා සමාජ අර්බුදයේ ම ප්‍රකාශනයක් ලෙස පසු ගිය වසරේ ජනාධිපතිවරනයෙන් අහමඩිනිජාඩ්ගේ ජයග්‍රහනය සිදු විය. "ඉරානයේ තෙල් සම්පත ජනතාවගේ මේස මත තබනු" යන ඔහුගේ ජනප්‍රිය සටන්පාඨ, අති බහුතරයකගේ වියදමෙන් සුලු පිරිසකට ඉමහත් ධන සම්පත් හිමි කර දුන් පූජක තන්ත්‍රය කෙරෙහි වඩාත් විශ්වාස භංගයට පත් කම්කරුවන් හා යෞවනයන් ඇද බැඳ ගැනීමට සමත් විය.

අහමඩිනිජාඩ්ගේ ජයග්‍රහනය අන් සියල්ලටත් වඩා පිලිබිඹු කලේ 1997 දී බලයට පත් හිටපු ජනාධිපති මොහොමඩ් කටාමි විසින් මෙහෙය වූ ඊනියා ප්‍රතිසංස්කරනවාදීන්ගේ දේශපාලන බංකොලොත්කම යි. කටාමි, ජීවන තත්වයන් ඉහල නැංවීමටත්, මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සුරක්ෂිත කිරීමට පොරොන්දු වූ නමුත් ඒ කිසිවක් ඉටු නො කලේ ය. කම්කරුවන්ගේ හා ශිෂ්‍යයන්ගේ සෑම සැලකිය යුතු ප්‍රතික්‍රියාවකට ම ඔහු ප්‍රතිචාර දක්වූයේ විසංවාදය බිඳ දැමීම සඳහා සංස්ථිතික දැඩි මතධාරීන් සමග වහා ම පෙලගැසීම මගින් ය. ඒ සමග ම ඔහු, වොෂින්ටනය අසල්වැසි ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය ආක්‍රමනය කර ඉරානයට ම එරෙහිව හමුදා ආක්‍රමනයක තර්ජනය එල්ල කල විට පවා, ඉරාන ආර්ථිකය විදේශ ආයෝජකයන්ට විවෘත කර දීමටත් ඒ තාක් දුරට යුරෝපය හා එක්සත් ජනපදය සමග සබඳතා වර්ධනය කර ගැනීමට ත් උත්සුක විය.

"ප්‍රතිසංස්කරනවාදීන්" කෙරෙහි වූ ජනතාවගේ පිලිකුල අහමඩිනිජාඩ් සිය වාසියට හරවා ගත් නමුදු බිලියන ගනන් ඉරානීයන් මුහුනපාන සමාජ හා ආර්ථික ව්‍යසනයට විසඳුම් ඔහු සතුව නො තිබුනි. ඉරානය සතු විශාල තෙල් හා ගෑස් සම්පත් ද දැන් පවතින ඉහල තෙල් මිල ද තිබියදී ම එහි ආර්ථිකය අතිඋද්ධමනය, ආයෝජන හිඟය හා අබලන් වූ යටිතල පහසුකම්වලින් පීඩාවට පත්ව ඇත. ජාතික ඉරාන තෙල් සමාගමේ තක්සේරුවකට අනුව රටේ අබලන් වූ යටිතල පහසුකම් නවීකරනයට ඉදිරි දස වසර තුල තෙල් කර්මාන්ත අංශයෙන් ඩොලර් බිලියන 70ක් දැඩි ලෙස අවශ්‍යව තිබේ.

රටේ ගැඹුරුවන සමාජ අර්බුදය ඉරනයට පනවන එක්සත් ජාතීන්ගේ ආර්ථික සම්බාධක මගින් තව දුරටත් උග්‍ර කරනු ඇත. ජනගහනය ඉතා තුරුනුවියේ පසුවෙයි. ආසන්න වශයෙන් සියයට 50ක් අවුරුදු 20ට අඩු අය වන අතර සියයට 70ක් වසර 30ට වඩා අඩු අය යි. නිල විරැකියා මට්ටම සියයට 16ක් වුවත් වෙනත් ගනන් බැලීම්වලට අනුව එමෙන් දෙගුනයකි. රැකියා වෙලඳපොලට අලුතින් ඇතුලුවන මිලියනයක් අතුරින් රැකියා ලැබෙන්නේ අඩකට පමනි. 2004 වසරේ ආන්ඩුවේ අධ්‍යයනයකට අනුව අවුරුදු 15-29 අතර වයස් කාන්ඩවල රැකියා වියුක්තිය වසර දෙකකටත් අඩු කාලයක් තුල සියයට 52ක් දක්වා අහස උසට නගිනු ඇත.

ඉරාන පාලක පන්තියට අහමඩිනිජාඩ් මත විශ්වාසය රැඳවීමට බලකෙරී තිබීමේ කාරනය ප්‍රකාශ කරන්නේ ඔවුන් මුහුන පා සිටින ගොඩ ඒ ගත නොහැකි අර්බුදය යි. ඉරාන මහජනතාවගේ අවශ්‍යතාවන් හා බලාපොරොත්තු ඉටු කිරීමට නොහැකිව සිටින පාලක පන්තියට බලකෙරී ඇත්තේ රට තුල සමාජ අර්බුදය විසඳීමට අසමත් ව සිටින හා පිටත දී අධිරාජ්‍යවාදය සමග උපාමාරු දමන ආන්ඩුව කෙරෙන් අවධානය වෙනතකට යොමු කිරීම් වස් යුදෙව් විරෝධය හා ස්වෝත්තමවාදය ඇවිස්සීම සඳහා ජනතාවාදී වාචාල දේශපාලනඥයෙකු වෙත නැඹුරු වීමට ය. ජාතික හදිසි තත්වයේ වාතාවරනය නිසැක ලෙස ම යොදා ගනු ඇත්තේ ඉරානය තුල පවතින සීමිත ප්‍රජාතන්ත්‍රීය අයිතීන් තව දුරටත් ආපසු කැරකවීමට හා විවිධ සුලු ජාතීන් ද ඇතුලත් විරුද්ධ පාක්ෂිකයන් මත කඩා පැනීමටත් ය.

එක්සත් ජනපදය හා එහි මිතුරන් සමග ගැටුම ගැඹුරු වෙද්දී වෙනත් විකල්පයක් නොමැති තත්වය තුල ටෙහෙරානයේ බල තන්ත්‍රය න්‍යෂ්ටික අවි ගොඩ නැගීම, අත්හදා බැලීම හා ගොඩනැගීමේ ක්‍රියා මාර්ගය ආරම්භ කල යුතු බවට තීරනය කර තිබේ. බුෂ් පරිපාලනය ජාත්‍යන්තර නීතිය කෙරෙහි දක්වන නොරිස්සීමක් මත් ප්‍රතිවිපාක කෙරෙහි දක්වන සාහසික නොතැකීමත් සමග ප්‍රකාශයට පත් කර ඇති හා ආක්‍රමනකාරී ලෙස ක්‍රියාත්මක කර ඇති එහි යුද නිවාරන ධර්මතාව සැබෑ අන්තරායන් මතු කරන බව නිසැක ය. ටෙහෙරානය එහි න්‍යෂ්ටික කටයුතු සීමා කල යුතු බව අවධාරනය

කරන අතර තුර එක්සත් ජනපදය න්‍යෂ්ටික අවි හරන ගිවිසුම අවඥාවට ලක් කරමින් හරියට ම ඉරානයේ ඇති වර්ගයේ පොලොව යට ආරක්ෂිත ඉදිකිරීම්වලට එල්ල කෙරෙන "බිංගෙවල්-බිඳින්නා" නම් න්‍යෂ්ටික අවිවල අලුත් වර්ගයක් ගොඩ නගමින් සිටියි.

කෙසේ වුවද කම්කරු පන්තියට ඊනියා ඉස්ලාමීය විප්ලවය හා ඉරාන රාජ්‍යය ආරක්ෂා කිරීම උමතු ජාතිකවාදී ව්‍යාපාරයක් තුලින් අනිවාර්යයෙන් ම යුක්ති සහගත කරනු ලබන ඉරාන න්‍යෂ්ටික අවියක් ගොඩ නැගීම සඳහා කිසිදු සහයක් දිය නොහැකි ය. න්‍යෂ්ටික යුද්ධයේ තර්ජනය අධිරාජ්‍යවාදී ආක්‍රමනකාරීත්වයට පිලිතුරක් නො වන අතර මැද පෙරදිග හා ඉන් එහා න්‍යෂ්ටික ජන සංහාරයක් සඳහා වූ ආහාර වට්ටෝරුවකි. අධිරාජ්‍යවාදයේ කොල්ලකාරී පිලිවෙත්වලට ද න්‍යෂ්ටික යුද්ධයේ අන්තරායන්ට ද එකම සැබෑ විකල්පය විප්ලවකාරී පන්ති අරගලයේ ක්‍රියා මාර්ගයයි.

අවශ්‍යවන්නේ යුද්ධයේ හා සමාජ අසමානතාවයේ මූල සාධකය - ධනවාදය හා යල් පිනූ ජාතික රාජ්‍ය පද්ධතිය - සමග පොර බැදිය හැකි දේශපාලනිකව ස්වාධීන වූ ජාත්‍යන්තර කම්කරු පන්තිව්‍යාපාරය ගොඩ නැගීම යි. සෑම වර්ගයකම ජාතිකවාදයට, වර්ගවාදයට හා ස්වෝත්තමවාදයට එරෙහිව, අතලොස්සකගේ ලාභය වෙනුවෙන් නොව සමස්තයක් ලෙස මනුෂ්‍යවර්ගයාගේ සමාජ අව්‍යතාවන් සාක්ෂාත් කරන්නා වූ ආර්ථික පද්ධතිය යලි ගොඩ නැගීම සඳහා සමාජවාදී රේඛා ඔස්සේ කම්කරු පන්තිය සිය අරගලයන් ඒකාබද්ධ කල යුතු ය. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පෙනී සිටින්නා වූත් ලොව පුරා එහි ශාඛාවන් සටන්වදින්නා වූත් ක්‍රියා මාර්ගය වන්නේ එය යි.

© www.wsws.org